# මක්ෂිම් ගෝර්කි ගේ මහා නවකතාව




**දොස්තර කීර්ති කුලසේකර**
(MBBS Mphil PhD)
ල ටරෝබ් විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය සහ බෙන්ඩිගෝ මූලික රෝහලේ වෛද්‍ය නිලධාරී.

**සුමිත් පෙරේරා ගේ සිතුවමින්**

පළමුවන පරිච්ඡේදය - හතරවන කොටස

## මයිකල් ගේ මරණ මංචකය

කාලය මෙසේ ගතවී ගොස් දැන් මයිකල් අබල දුබල වී ඇත.

මයිකල්ගේ මරණය ඉතා ඉක්මනින් ලඟා වුවකි. ඔහු මැරුනේද ගහක් ගලක් මෙන් ඉතා කෙටි කාලයක් ඇතුලතය.

දවසක් පහක් හයක් ඇඳේ වකුටු වී සිටි මයිකල් තනිකරම කළුම කළු පැහැ වුයේය.

දත් කිටි කිටි ගා හපමින් මුළු ඇඟම සීතලේ ගැහෙමින් ඇඳටම වී සිටීම ඔහුගේ මරණ මංචකය විය.

සමහර විට ඔහු තමාට වතුර වීදුරුවක් රැගෙන එන බිරිඳට මෙසේ කියයි.

"මට වහ ටිකක් දීපන් ඉක්මනට මැරිලා යන්න.."

ඇය ගමේ සිටි වෙදාට කතා කළාය. ඔහු කිසියම් කෂායක් නියම කළේය.

"ලෙඩාට ඔපරේෂන් එකක් කරන්න වෙනවා . ඉක්මනට මෙයාව ඉස්පිරිතාලෙකට අරන් පලයල්ලා" වෙදා නියෝග කළේය.

මයිකල් නොවේ ඉස්පිරිතාලෙට යන්නට කැමති වුයේ .

"තොපි පලයව්.. මළ පෙරේත හැතිකරේ.. මට මගේ පාඩුවේ මැරෙන්න ඉඩ දියව්.." මයිකල් ලෙඩ ඇඳටම වීත් ගෝරනාඩු කළේය.

වෙදා පිටත් වූ පසු ඇඩූ කඳුලින් පසුවූ පාවෙල් ගේ මව ඔපරේෂන් එක කර ගන්නා ලෙස මයිකල්ට බැගෑපත් වුවාය. තම දුර්වල එහෙත් රළු අත් මිට මොලවාගත් මයිකල් තම බිරිඳට තර්ජනය කළේය.

"උඹට පිස්සුද යෝදියේ ...? උඹේ කරදර තවත් වැඩි වෙනවා මම ඉතුරු වුනොත් .. මළ පෙරේති.."

එක් උදැසනක කම්මලේ හයේ සංගුව වදින වෙලාවේ මයිකල් මිය ගියේය. සංගුව ගමේ මිනිස්සුන්ට වැඩට එන්න කියද්දී මරුවා මයිකල්ට එන්න කීවේය.

ඔහු මිනී පෙට්ටියේ වැතිරී සිටියේ කට ඇරගෙනයි. ඔහුගේ ඇහි බැමි තදින් වැසී තිබුනේ යම් කේන්තියක් පිට කරන්නා මෙනි. මයිකල් වල දාන දවසේ එතැන සිටියේ සිය බිරිඳත්, පුතාත්, බල්ලාත්, ගමේ තවත් බේබද්දෝ කීපදෙනෙකුත් පමණි. බේබද්දෙක් සහ හොරෙක් වූ දනියෙල්ද මේ අතර විය.

බිරිඳ තනිවම සුසුම් හෙලමින් අඬනවා දක්නට ලැබිණි. පාවෙල් කිසිම ශෝකයක් ප්‍රකාශ කළේ නැත.

මිනිය පෙර මගට හමුවූ ගම්මු එකිනෙකා හමුවී කතාකලේ මේ මරණයේ ප්‍රතිඵල ගැනයි.

"පෙලගුයෙයා අඬනවා නෙවෙයි සන්තෝෂ වෙන්න ඕනි දැන් . දැන් ඉතින් ගෑනිට දෙය්යනේ කියලා කොල්ලත් හදාගෙන ඉන්න පුළුවන්"

සමහර ගැමියෙක් මෙය වෙනස් ආකාරයකට ප්‍රකාශ කළේය.

"මිනිහා මරුන නෙවයි බිලා බිලා කුණුවෙලා දිරලා ගියා. "

මෘත ශරීරය භූම දානයෙන් පසු මිනිසුන් සුපුරුදු පරිදි කඩ පොලට හෝ නිවෙස් බලා හෝ ගියෝය.

එහෙත් බල්ලා දිගු වේලාවක් සොහොනේ රැඳී සිටියේය.

මිනී වල වසා තිබු නැවුම් පසේ නිහඬව වැතිරී පැය ගණනක් සිටියේය.

විටෙක මිනීවල ඉව කරමින් තම ස්වාමියා සොයන්නට විය.

**දෙවන පරිච්ඡේදය**

පළමු කොටස



## බීමතින් ගෙදර ආ පුතා

දැන් පාවෙල් ගේ පියා මිය ගොස් සති දෙකක් පමණ ගත වී තිබේ . එදා ඉරිදා දිනයකි. එදා පාවෙල් නිවසට ආවේ කටගොන්නක් බී ගෙනයි. වැනි වැනී ගෙට ගොඩවූ ඔහු සාලයේ මුල්ලක වූ මේසයට සේන්දු විය.

මුළු වැර යොදා තම මිට මෙලවූ අතින් මේසයට පහර දුන් පාවෙල් .. "කෝ.. කෑම".. කියමින් සිය මවට කෑගැසුවේය. ඔහුගේ ඉරියව් සහ මිටිගුලියෙන් මේසයට පහර දුන් ආකාරය සිහිගැන්වුයේ මයිකල් වෙරි වී වූ විට ක්‍රියා කරන ආකාරයයි.

අම්මා පාවෙල් දෙසට ගමන් කළාය. තම දයාබර පුතු ලග පසෙකින් හිඳගත් ඈ ඔහු කර වටා අතක් යවා ඔහුගේ හිස තම ළයට තුරුළු කර ගත්තාය.

තම දෙඅත් මවගේ දෙඋර මත තැබූ පාවෙල් ඇය පසෙකට තල්ලු කළේය.

"අම්මා .. ඉක්මනට ... කෝ මගේ කෑම එක ?" යැයි නැවතත් කෑ ගැසුවේය.

"මෝඩ කොල්ලා.... උඹේ මොළේ නරක් වී ගෙන එනවද?" මව දුක්මුසු එහෙත් ඉතා ආදරණිය ස්වරයෙන් ඇසුවාය.

එසේ අසමින්ම ඇය තම පුතුගේ හිස තම ළය වෙත ලංකර ගන්නට උත්සාහ කලාය.

"අද ඉඳලා මම බොනවා විතරක් නෙවෙයි සුරුට්ටුත් බොනවා".

"කෝ තාත්තගේ පයිප්පේ" තම දිව එහාට මෙහාට වනමින් පාවෙල් මිමිණුවේය.

ඒ පාවෙල් වෙරි වී පැමිණි පළමු අවස්ථාවයි. මධ්‍යසාර ඔහුගේ තරුණ සිරුරේ සාරය උරාගෙන තිබුනේ එය තවත් දුර්වල කරවමිනි.

එහෙත් ඔහුගේ පියව් සිහිය නැති කරන්නට තරම් මධ්‍යසාර සමත්වී නැති සෙයකි.

"මට වෙරිද?.. වෙරිද?" යන ප්‍රශ්නය බමන මතින් සිටි ඔහුගේ හිස තුළ දෝංකාර දුන්නේය..

මවගේ තම හිස අතගාමින් කල ආදරණිය සුරතල් කිරීම ඔහු අපහසුවට පත් කළේය. ඇයගේ දෑසේ තිබු දුක්බර පෙනුම ඔහු තවත් අපහසුවට පත් කළේය.

ඔහුට ඉකි ගසා හඬන්නට ඇත්නම් යැයි සිතුනේ තම මවගේ දුක්බර දෑස ළග සිය නෙත් නැවතුනු ඒ නිමේෂයයේය.

තම සිතේ පැන නැගුනු මේ ශෝකී භාවය මග හරවා ගන්නට සිතු පාවෙල් තමා හොඳටම වෙරි වී සිටි බව මවට ඒත්තු ගන්වන්නට උත්සහ කළේය.
අම්මා ඔහුගේ අකීකරු කෙහෙරැළි අතරින් තම අතැඟිලි යැව්වේ යැව්වේ රිද්මයකටයි.

ඒ අතර තම ආදරණිය පුතු අමතා....

"උඹ මොකද මගේ පුතේ බිව්වේ ? .. උඹට එහෙම නොකර ඉන්න තිබුණා.." යැයි සිහින් ආදරණිය හඬකින් පැවසුවාය.

පාවෙල්ට වමනේ යන්න ඔන්න මෙන්න වාගේ දැනිණ.

ඕක්.. ඕක්.. හඬක් නගමින් ඔක්කාරය කරන්නට දඟලන තම ආදරණිය පුතු දෙස අම්මා අනුකම්පාවෙන් බලා සිටියාය.

අනතුරුව ඔහුව වත්තන් කරගෙන ඇඳ ලඟට රැගෙන ආ ඇය තම පුතු නින්දට දැමුවාය.

ඒ ඕඩිකොලොන් තැවරූ රෙදි කැබැල්ලක් ඔහුගේ සුදුමැලි වී ගිය නළල මතට දැමීමෙන් පසුවයි.

ටික වෙලාවකින් තරමක් වෙරි හිඳුන බවක් පාවෙල්ට දැනුණි. එහෙත් තමා සිටි ඇඳ පමණක් නොව ඔහු වටා ඇති සියළුම දේවල් වේගයෙන් භ්‍රමණය වන බවක් පාවෙල්ට දැනෙන්නට විය.

තම ඇහි බැම උසුලා ගත නොහැකි තරම් බර බවත්, ඉවසිය නොහැකි තරම් තිත්ත අම්හිරි රසයක් තම දිවගට දැනෙන බවත් ඔහුට තේරුම් යන්නට විය.

දිගු ඇස් පෙදි තුලින් තම සදාදරණිය මවගේ පුළුල් වටකරු මුහුණ දෙස බැලූ පාවෙල් මෙසේ සිතන්නට විය.

"බොන්න මම තාම පොඩි වැඩියි වගේ.. අනික් එවුන් බොනවා උන්ට ඉහින් බහින අමාරුවක් නෑ..හැබැයි මට පුදුම අමාරුවක් දැනෙන්නේ..."

**මතු සම්බන්ධයි**